# <u>බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව</u>

දිනය : 2023.10.26

වේලාව : ප.ව.2.30

ස්ථානය : ප්‍රධාන ලේකම් රැස්වීම් ශාලාව

මූලාසනය : **ප්‍රදීප් යසරත්න මහතා (ප්‍රධාන ලේකම්)**

<u>සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය</u>

| | | | |
|---|---|---|---|
| 01) | පී.සෝමසිරි මහතා | - | ආණ්ඩුකාර ලේකම් (බ.ප.) |
| 02) | තිලක් සෙනරත් මහතා | - | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප) |
| 03) | යූ.බී.ආර්.රාජපක්ෂ මහතා | - | සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප) |
| 04) | සිරිසෝම ලෙකුවිතාන මහතා | - | ලේකම්,අධ්‍යාපන අමාත්‍යාංශය(බ.ප) |
| 05) | කේ.චම්පා එන්. පෙරේරා මිය | - | ලේකම්,ප්‍රවාහන හා මාර්ග අමාත්‍යාංශය(බ.ප) |
| 06) | ඒ.ඩී.එස්.සදීකා මිය | - | ලේකම්,පළාත් පාලන අමාත්‍යාංශය(බ.ප) |
| 07) | චන්දන රණවීර ආරච්චි මයා | - | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප.) |
| 08) | එල්.ඒ.කළුකපුආරච්චි මයා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 09) | ඩබ්ලිව්.ටී.ඒ.මානෙල් මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 10) | ඒ.එම්.එස්.මල්කාන්ති මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |
| 11) | කේ.ඒ.ඩී.කේ.සිරිවර්ධන මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 12) | කේ.ආර්.අබේසිරිවර්ධන මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 13) | පී.පී.විජේවීර මිය | - | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| 14) | පාලිත අබේවර්ධන මහතා | - | ප්‍රධාන නීති නිලධාරී |
| 15) | කේ.එන්.සූරියආරච්චි මිය | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2023.10.26 දින පැවති ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාවයි.

| අනු අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01 | ගුරු පුරප්පාඩු සඳහා නව බඳවා ගැනීම් සම්බන්ධව | බස්නාහිර පළාත් පාසැල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා ගුරුවරුන් බඳවා ගැනීමට පවත්වන තරඟ විභාග, සම්මුඛ පරීක්ෂණ හා ඒ සම්බන්ධව පැන නැගී ඇති ගැටළු පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලදී.<br>දැනට බඳවා ගැනීම් සම්පූර්ණ කර ඇති ගුරු විභාගයේ ප්‍රතිඵල පළාත් රාජ්‍ය කොමිෂන් සභා වෙබ් අඩවියෙහි කඩිනමින් පල කිරීමට තීරණය විය. | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 02. | බහු කාර්ය සංවර්ධන සහයකයින් PL2 PL3 කාණ්ඩයට ඇතුලත් කිරීම සම්බන්ධව | බහු කාර්ය සංවර්ධන සහයකයින් සම්බන්ධයෙන් මේ වන විට බහුකාර්ය දෙපාර්තමේන්තුව මඟින් PL1 වර්ගය යටතේ බඳවා ගත් බහු කාර්ය සංවර්ධන සහයකයින් PL2, PL3 කාණ්ඩයට ඇතුලත් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් අනුමැතිය ලබා දී ඇති අතර ඒ අනුමැතියට සමගාමීව පළාත් සභා සඳහා බඳවා ගැනීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් උපදෙස් ලබා දී ඇති බවත් පුහුණුව සඳහා බඳවා ගැනීමේදී වයස අවුරුදු 45 අඩු බහුකාර්ය සංවර්ධන සහයකයින් හට පත්වීම් ලබා දීමට අනුමැතිය ලබා දී ඇති බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>ඒ අනුව ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය ලබාගෙන ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට පළාත් රාජ්‍ය කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති බව වැඩි දුරටත් සඳහන් කරන ලදී.<br>ඒ අනුව පවතින විදුලි කාර්මික හා රියදුරු පුරප්පාඩු හැකි ඉක්මනින්ම සම්පූර්ණ කිරීමටත් එම තනතුරු වලට බඳවා ගත් අභ්‍යන්තර බහු කාර්ය සංවර්ධන සහයකයින් අතරින් සම්මුඛ පරීක්ෂණයක් සිදුකර ඒ මඟින් සුදුසුකම් පරීක්ෂාකර පත්වීම් කඩිනමින් ලබා දීමටත් තීරණය කරන ලදී. | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |
| 03 | නොමිලේ භාණ්ඩ බෙදා දීමේ සමාජසේවා වැඩසටහන් ක්‍රියාත්මක කිරිම සම්බන්ධව | නොමිලේ භාණ්ඩ බෙදා දීමේ (ඇස් කණ්නාඩි / රෝද පුටු ආදී) සමාජ සේවා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පෙර එම වැඩසටහන් ක්‍රියාත්මක කරන මාසයට පෙර මාසයේදී එවැනි වැඩසටහන් සඳහා අනුමැතිය ලබා ගතයුතු බවත් අදාළ ආකෘතිය මඟින් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කල යුතු බවත් ඉන් අනතුරුව එය ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව වැඩසහන ක්‍රියාත්මක කිරීමටත් තීරණය විය. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

<table>
<tr>
<td>04</td>
<td>ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව</td>
<td>
2023 වර්ෂයේ අමාත්‍යාංශ මට්ටමින් ප්‍රතිපාදන වැය කිරීමේ ප්‍රගතිය සාකච්ඡා කරන ලදී.එම ප්‍රගතිය පහත සඳහන් පරිදිවන බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.
<table>
<tr><th>අමාත්‍යාංශය</th><th>මූල්‍ය ප්‍රගතිය</th><th>භෞතික ප්‍රගතිය</th></tr>
<tr><td>පළාත් පාලන අමාත්‍යාංශය</td><td>62%</td><td>85%</td></tr>
<tr><td>සෞඛ්‍ය අමාත්‍යාංශය</td><td>51%</td><td>71%</td></tr>
<tr><td>අධ්‍යාපන අමාත්‍යාංශය</td><td>57.6%</td><td>82.5%</td></tr>
<tr><td>කෘෂිකර්ම අමාත්‍යාංශය</td><td>47%</td><td>78%</td></tr>
<tr><td>ප්‍රවාහන අමාත්‍යාංශය</td><td>54.6%</td><td></td></tr>
</table>
සෑම අමාත්‍යාංශයකම භෞතික ප්‍රගතියට වඩා මූල්‍ය ප්‍රගතිය අඩු මට්ටමක පවතින බැවින් එසේ වීම සම්බන්ධව එක් එක් අමාත්‍යාංශ මට්ටමින් කරුණු විමසන ලදී.<br><br>
එසේම කෘෂිකර්ම අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රගතිය 47% ක මට්ටමක පැවතීම පිළිබඳ කරුණු සාකච්ඡා කළ අතර පවතින අධික වර්ෂා තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පවතින අපහසුතාවය පිළිබඳ කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් කරුණු දක්වන ලදී.ඉතිරි මාස දෙකක පමණ කාල සීමාව තුල ව්‍යාපෘති අවසන් කිරීමට කටයුතු කරන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් ලබා දෙන ලදී.අවිස්සාවේල්ල රෝහල ඉදිකිරීම සම්බන්ධව කරුණු සාකච්ඡා කළ අතර එම ගොඩනැගිල්ලේ ගොඩනැගිලි සැලසුම් නිර්මාණය සඳහා පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඒ සඳහා රුපියල් මිලියන 15 ක මුදලක් ඉල්ලුම් කර ඇති බව සෞඛ්‍ය අමාත්‍යාංශ වැ.බ. ලේකම් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.එම ගොඩනැගිල්ල විවෘත කිරීම සඳහා දෙසැම්බර් මස මුල්ගල තබා කටයුතු ආරම්භ කරන ලෙස ගරු අග්‍රාමාත්‍යතුමා විසින් දන්වා ඇති බවත් , එම ගොඩනැගිල ඉදි කිරීම සඳහා වන එක් එක් කටයුතු වෙන වෙනම ආයතන වලට පවරා ඇති අතර ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු වල සියලූ වගකීම එක් ආයතනයකට පමණක් පැවරීම සුදුසු බව සාකච්ඡා කරන ලදී. මෙම ගොඩනැගිල්ලේ කටයුතු සම්බන්ධව අවසන් තීරණයක් ගැනීමට ගරු ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡා කිරීමට තීරණය කරන ලදී.<br><br>
2024 වර්ෂයේ සිදු කිරීමට බලාපොරොත්තුවන ව්‍යාපෘති සම්බන්ධව සඳහන් කළ අතර ප්‍රතිපාදන වෙන් කිරීමට යටත්ව අනුමැතිය ලබා දීමට කටයුතු කරන බවත් ඒ අනුව ප්‍රතිපාදන ලැබෙන තෙක් ඒ සඳහා කටයුතු සිදු කරන ලෙස ගරු ආණ්ඩුකාරතුමා විසින් දන්වා ඇති බවත් , සියලූම අමාත්‍යාංශ ලේකම්වරුන් ඒ සඳහා ඉංජිනේරු අංශයට සහයෝගය ලබා දෙන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>
තවද සෑම අමාත්‍යාංශයකම සිටින සැලසුම් අධ්‍යක්ෂවරුන් සතියකට කිහිප වරක් හෝ කැඳවා ඔවුන් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව උනන්දු කරවීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) වෙත උපදෙස් ලබා දෙන ලදී.
</td>
<td>සියලූම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් / ඉංජිනේරු)</td>
</tr>
</table>



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| | | 2024 අයවැය ප්‍රතිපාදන වෙන කිරිමේදී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරු විසින් ඉදිරිපත් වූ යොජනාවන්ට අනුව බස්නාහිර පළාත් දිස්ත්‍රික් තුන සඳහා රුපියල් මිලියන 4500 ක මුදලක් වෙන් කිරිමට කටයුතු කරන ලදී.<br><br>ඒ අනුව සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් සමඟ සම්බන්ධ වී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේ කටයුතු සිදු කරන ලෙස දන්වන ලදී.තවද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේදී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු වලින් ඉදිරිපත් වූ ඇතැම් ව්‍යාපෘති වෙනස් කිරිමට ඉඩ ඇති අතර ඒ අනුව අමාත්‍යාංශ වලට ව්‍යාපෘති පැවරීමට කටයුතු කරන බවත් දිස්ත්‍රික් තුන සඳහා වෙන්කර ඇති රු. මිලියන 4500 ක ප්‍රතිපාදන යටතේ එක් එක් දිස්ත්‍රික්කයට වෙන්කර ඇති ප්‍රතිපාදන සීමාවද ඉක්මවා නොයන පරිදි පළාත් සභා මාර්ගෝපදේශකත්වයන්ට යටත්ව එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී.<br><br>තවද 2024 අය වැයෙන් බස්නාහිර අමාත්‍යාංශවල ව්‍යාපෘති සඳහා වෙන් කෙරෙන ප්‍රතිපාදන වලින් අමාත්‍යාංශ මට්ටමින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලබා දෙන බවද වැඩි දුරටත් දන්වන ලදී.ඒ අනුව 2024 වර්ෂයේ ව්‍යාපෘති සඳහා වෙන් කෙරෙන ප්‍රතිපාදන වලින් වර්ෂය මුලදී ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කරන ලෙස සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | |
| 05 | කාර්ය සාධන තරඟාවලිය | කාර්ය සාධන තරඟාවලියට අදාළව බස්නාහිර පළාත් සභා අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු හා ආයතන 387 කට අදාළව විනිශ්චය කටයුතු මේ වන විට 50%ක් පමණ සිදු කර අවසන් කර ඇති බවත් ඉතිරිව ඇති ආයතන වල විනිශ්චය කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු දක්වන ලදී.<br><br>ඒ අනුව දෙසැම්බර් මස ජයග්‍රාහකයින් සඳහා සහතික ලබා දීමට කටයුතු සංවිධානය කරන අතරම සහතික පත් සඳහා ආකෘති සකස්කර අවසන් කර ඇති බවත් වැඩි දුරටත් සඳහන් කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 06 | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ගොඩනැගිල්ලේ පවතින ගැටළු සම්බන්ධව | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලිපිද්‍රව්‍ය වර්ෂා ජලයෙන් විනාශ වීම සම්බන්ධව ශ්‍රී ජයවර්ධනපුර මහ නගර සභාවේ නිලධාරීන් සමඟ පැවති සාකච්ඡාවේ ප්‍රගතිය සම්බන්ධව සාකච්ඡා කරන ලදී.<br><br>මේ වන විට ගොඩනැගිල්ලේ පිළිසකර කිරීමේ කටයුතු සිදු කරමින් පවතින බවට කරුණු සාකච්ඡා කළ අතර , එම සාකච්ඡාවේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් වන විදුලි බිල් මනු කියවීමේ අනුපාත ඉදිරිපත් නොවීම සම්බන්ධව මෙතෙක් විසඳුමක් ලැබී නොමැති බව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී. තවද එම ගොඩනැගිල්ලේම පිහිටා ඇති සමූපකාර කොමිෂන් සභාවටද මෙම ගැටළුව පවතින බවට කරුණු සාකච්ඡා කරන ලදී.<br><br>මේ පිළිබඳ සොයා බලා ඊට සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙසට පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත දන්වන ලදී. | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශ |



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 07 | බස්නාහිර පළාත් සභාවට අයත් කාර්යාල පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය තුල ස්ථාපිත කිරීම සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවට අයත් කුලී පදනම මත පවත්වාගෙන යන ආයතන වන ඉඩම් කොමසාරිස් කාර්යාලය, ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හා පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය (කොළඹ) යන ආයතන පළාත් සභා සංකීර්ණයෙහි ස්ථාපිත කිරීම සම්බන්ධව දැනට සිදුකර ඇති කටයුතු මෙන්ම ඉදිරියේදී සකස් කිරීමට පවතින කොටස් සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලදී.<br><br>තවද පළමු මහලේ පිහිටුවා ඇති ලංකා බැංකු ශාඛාවේ මුදල් තැන්පත් කිරීමේ ටෙලර් යන්ත්‍රයක් සවිකරන ලෙස ඔවුන් දැනුවත් කර ඇති බවත් ඊට අමතරව පළමු මහලේ මහජන බැංකු අනු ශාඛාවක් ස්ථාපිත කිරීම සුදුසු බවත් තීරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 08 | ජනාධිපති ලේකම් හා අග්‍රාමාත්‍ය ලේකම්ගේ ලිපි සඳහා කඩිනමින් ප්‍රතිචාර නොදැක්වීම සම්බන්ධව | ජනාධිපති ලේකම් හා අග්‍රාමාත්‍ය ලේකම්ගේ ලිපි සඳහා කඩිනමින් ප්‍රතිචාර දැක්වීමට කටයුතු කරන ලෙස දැනුවත් කර ඇති නමුත් මෙතෙක් යහපත් ප්‍රතිචාර දක්නට නොමැති බවට ප්‍රධාන ලේකම් විසින් කරුණු දක්වන ලදී.<br><br>මේ සම්බන්ධයෙන් මාණ්ඩලික නිලධාරීන්ගේ විශේෂ අවධානයක් යොමු කර විධිමත් පරිදි සකස් කල පිළිතුරක් යවන තෙක් සතියක් ඇතුළත අතුරු පිළිතුරක් හෝ යැවීමට කටයුතු කරන ලෙස අමාත්‍යංශ යටතේ පවතින සියලු දෙපාර්තමේන්තු හා ආයතන දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් සියලු අමාත්‍යංශ ලේකම්වරුන් වෙත උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යංශ ලේකම්වරු |
| 09 | තොරතුරු මධ්‍යස්ථානය සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යංශ මට්ටමින් සිදු කරනු ලබන ව්‍යාපෘති සම්බන්ධ තොරතුරු ලබා ගැනීම මූලික කරගෙන තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට කටයුතු කරන බවත් ඒ සඳහා කැබිනට් පත්‍රිකාවන් සකස්කර ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ඉදිරිපත් කර ඇති බවත්, ප්‍රධාන ලේකම් විසින් කරුණු දක්වන ලදී.<br><br>මෙය ඒකකයක් වශයෙන් ක්‍රියාත්මක වන අතර මේ මඟින් විශේෂ ව්‍යාපෘති සඳහා පසු විපරම් කිරීම , පැන නඟින ගැටළු පිළිබඳ තොරතුරු දැන ගැනීම හා එම ගැටළු නිරාකරණය කර ගනිමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මූලිකත්වය කරගෙන මෙම ඒකකය ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.<br><br>බස්නාහිර පළාතට අයත් ඕනෑම අමාත්‍යංශයකින්, දෙපාර්තමේන්තුවකින් හෝ ව්‍යවස්ථාපිත ආයතනයකින් තොරතුරු ලබා ගැනීමට මෙම ඒකකයට බලය ඇත.<br><br>ව්‍යාපෘති පිළිබඳ වර්තමාන තත්ත්වය හා ගැටළු සම්බන්ධව මෙම ඒකකය ඕනෑම අවස්ථාවක ප්‍රධාන ලේකම් හා ආණ්ඩුකාරතුමා දැනුවත් කිරීමට අවශ්‍ය තොරතුරු ඇතුලත් වන පරිදි ක්‍රියාකල යුතු බවත් ප්‍රධාන ලේකම් විසින් වැඩි දුරටත් සඳහන් කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 10 | බස්නාහිර පළාත් සෞන්දයී නිකේතනය නවීකරණය කිරිම සම්බන්ධව | බස්නාහිර පළාත් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යංශය යටතේ පවත්වාගෙන යන සෞන්දයී නිකේතනය සතු ශ්‍රවනාගාරය වර්තමාන අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි නවීකරණය කිරීමට කටයුතු කිරීම සම්බන්ධව සාකච්ඡා කරන ලදී.<br><br>කලා ක්ෂේත්‍රයට අයත් ප්‍රවීණයන්ගේ අදහස් ලබා ගෙන වර්තමානයේ පවතින නවීන ශ්‍රවනාගාර මට්ටමට එය සකස් විය යුතු බවට තීරණය කරන ලදී. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 11 | නිවාඩු දින වැටුප් ඉල්ලුම් කරන නිලධාරීන් සඳහා නිවාඩු දින වැටුප් ඉල්ලුම් කිරිම පිළිබඳ තීරණයක් ගැනීම සම්බන්ධව | සෞඛ්‍ය අමාත්‍යංශය යටතේ ඇති පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සඳහා නිවාඩු දින වැටුප් ඉල්ලුම් කිරීමේ සීමාවන් නියම කිරීමේ අවශ්‍යතාව පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යංශ වැ.බ. ලේකම් විසින් අදහස් දක්වන ලදී.<br><br>එමෙන්ම නිවාඩු දින සේවය කිරිම සම්බන්ධව අභ්‍යන්තර විගණන පරික්ෂා කිරීම් මඟින් විගණන විමසුමක්ද සෞඛ්‍ය අමාත්‍යංශය වෙත මේ වන විට ඉදිරිපත් වී ඇති බවත් වැඩි දුරටත් සඳහන් කරන ලදී.<br><br>සෞඛ්‍ය අංශ වෙත නිවාඩු දින වැටුප් සීමා කිරිම මඟින් පෙරදී ඇතිවූ ගැටළු සාකච්ඡා කිරීමෙන් අනතුරුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2023 අනුව නිවාඩු දින වැටුප් දින දෙකක් ලබා දීම අමාත්‍යංශ ලේකම් මඟින් සිදු කරන ලෙසත් , ඊට වැඩිවන නිවාඩු දින වැටුප සඳහා රාජකාරී වෙලාවේදී නිම කිරීමට නොහැකි රාජකාරියක් බවට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ නිර්දේශ සහිතව ඉල්ලුම්පත් යොමු කිරීමටත් නිවාඩු දින වැටුප් ඉල්ලුම් කරන ඉල්ලුම් පත්‍රයේ ආකෘතිය ඒ පිළිබඳ සියලු තොරතුරු ඇතුලත් වන පරිදි වෙනස් විය යුතු බවත් තීරණය කරන ලදී. | සියලුම අමාත්‍යංශ ලේකම්වරු හා සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 12 | තාක්ෂණ නිලධාරීන් සඳහා විදේශගත වීමට නිවාඩු ලබා දීමේදී රාජකාරී ආවරණය සඳහා නිලධාරීන් පත් කිරීම සම්බන්ධව | ඉංජිනේරු කාර්යාංශයේ තාක්ෂණ නිලධාරීන් හතර දෙනෙකු හා ඉංජිනේරුවරයෙකු මේ වන විට විදේශගතව ඇති බවත්, ඊට අමතරව තාක්ෂණ නිලධාරිවරයෙකු හා තාක්ෂණ සහකරුවෙකු විදේශගත වීමට ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති බවත්, දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමේදී ඒ සඳහා නිර්දේශ ලබා දීමේ කමිටුව මඟින් මෙවැනි තනතුරුවල නිලධාරීන් දේශීය/විදේශීය නිවාඩු ගැනීම ආයතන පවත්වාගෙන යාමේදී බාධාවක් වන බැවින් ලේකම්වරුන්ගේ රැස්වීමේදී පොදු තීරණයක් ගැනීමට ඉදිරිපත් කර ඇත.<br><br>නිවාඩු අයදුම් කරන නිලධාරියාගේ තනතුරුවල රාජකාරී ආවරණය තම කාර්ය මණ්ඩල තුළින් ඉටුකරවා ගැනීමට හැකියාව / නොහැකියාව සලකා බලමින් අදාළ නිවාඩු ඉල්ලුම්පත් නිර්දේශ කිරිම /නොකිරීම ආයතන ප්‍රධානීන් විසින් සිදු කල යුතු බවට තීරණය කරන ලදී.<br><br>ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශ මත පදනම්ව කමිටුව විසින් සුදුසු තීරණ ගත යුතු බවත් තීරණය විය. | සියලුම අමාත්‍යංශ ලේකම්වරු හා සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 13 | මාධ්‍ය ඒකකයේ නිලධාරීන් ප්‍රධාන ලේකම් කාර්යාලයේ සැලසුම් අංශයට අනුයුක්ත කිරීම සම්බන්ධව | පළාත් පාලන අමාත්‍යංශයේ මාධ්‍ය ඒකකයේ සේවයේ නියුතුව සිටි ශ්‍රව්‍ය දෘශ්‍ය පටිගත කිරීමේ ශිල්පී අසංක උදේශ් සහ කැමරාකරණ හා සංස්කරණ ශිල්පී එච්.ආර්.පී .කල්දේරා යන නිලධාරීන් 2021.10.08 දින සිට ප්‍රධාන ලේකම් කාර්යාලයේ සැලසුම් අංශයට අනුයුක්ත කර ඇති බවත්, ඔවුන් වෙත බස්නාහිර පළාත් සැලසුම් යටතේ වන සංවර්ධන ව්‍යාපෘති මාණ්ඩලික නිලධාරීන්ගේ දැනුම් දීම මත ක්ෂේත්‍ර පරික්ෂාවන් ඡායාරූප ගත කිරීම හා එම ඡායාරූප වාර්තා හා වීඩියෝ සංවර්ධන නිලධාරීන් හා එක්ව මාසිකව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) වෙත ඉදිරිපත් කිරීම හා සැලසුම් අංශයට පැවරෙන රැස්වීම් / විශේෂ උත්සව අවස්ථා වීඩියෝ කිරීම ඡායාරූප ගත කිරීම හා එම තොරතුරු නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) වෙත ඉදිරිපත් කිරීම යන රාජකාරී පවරන ලදී.<br>එහෙත් රාජ්‍ය වියදම් සීමා කිරීම හේතුවෙන් හා කාර්යාලයේ සංවර්ධන නිලධාරීන් /ව්‍යාපෘති නිලධාරීන් 20 දෙනෙකු විසින් අදාළ ක්ෂේත්‍ර රාජකාරී ඉටුකළ බැවින් මෙම නිලධාරීන් දෙදෙනාගේ සේවය අවශ්‍ය නොවීය.ඔවුන්ගේ සේවය ලබාගත හැකි අවස්ථාවලදී පවා ඔවුන් සතුව උපකරණ නොමැති වීම හේතුවෙන් ඔවුන්ගේ සේවය ලබාගත නොහැකි වී ඇත.එබැවින් ඔවුන්ගේ සේවය සැලසුම් අංශයට අවශ්‍ය නොවන බැවින් එම නිලධාරීන් නැවත පළාත් පාලන අමාත්‍යංශය වෙත සේවයේ යෙදවීමට කටයුතු කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් කරුණු දක්වන ලදී.<br>ඒ සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමෙන් පසුව තව දුරටත් මේ පිළිබඳ සාකච්ඡා කර තීරණයක් ගැනීමට තීරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් / පිරිස් පුහුණු) |
| 14 | සමූහ ජීවිත රක්ෂණාවරණය සම්බන්ධව | සමූහ ජීවිත රක්ෂණාවරණය සම්බන්ධව නිලධාරීන් දැනුවත් කිරීම සඳහා එම රක්ෂණාවරණයේ ප්‍රතිලාභ සඳහන් අත් පත්‍රිකාවක් සකස් කර සියළු නිලධාරීන් වෙත ලබා දීමට කටයුතු කරන ලෙසත් , සියළු ආයතන ප්‍රධානීන් විසින් තමන්ගේ ආයතනවල නිලධාරීන් මේ පිළිබඳව දැනුවත් කිරිමට පියවර ගත යුතු බවත් තීරණය විය. | සියලුම අමාත්‍යංශ ලේකම්වරු හා සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 15 | වැටුප් රහිත නිවාඩු අය කිරීම සඳහා අධිකරණ ක්‍රියාමර්ග ගැනීමට ඉල්ලීම් සිදු කිරීම සම්බන්ධව | ඇතැම් අමාත්‍යංශවල වැටුප් රහිත නිවාඩු අයකර ගැනීමට කටයුතු නොකර අධික කාලයක් එකතු වූ වැටුප් රහිත නිවාඩු අයකර ගැනීම සඳහා අධිකරණ ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කරන බවට ප්‍රධාන නීති නිලධාරී විසින් කරුණු ඉදිරිපත් කරන ලදී .<br>වැටුප් ගෙවීමේදී ඊළඟ මාසයේදීම එය අයකර නොගැනීම පරිපාලනමය ගැටළුවක් වන බවත්, සෞඛ්‍ය හා අධ්‍යාපන අමාත්‍යංශ මෙවැනි ගැටළු වැඩි වශයෙන් ඉදිරිපත්වන අමාත්‍යංශයන් බවත් වැඩි දුරටත් සඳහන් කරන ලදී.<br>ඒ අනුව වැටුප් රහිත නිවාඩු අය කිරීම ඊළඟ මාසයේදී වැටුප් ගෙවන අවස්ථාවේදීම සිදු කිරීමට කටයුතු කරන ලෙසත් , මුදල් අයකර නොගැනීම පරිපාලනමය ගැටළුවක් වන අතර ඒ සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාවක් නොමැති බවත් , මේ පිළිබඳ සියලුම අමාත්‍යංශ ලේකම්වරුන් තම අමාත්‍යංශ යටතේ පවතින සියලුම දෙපාර්තමේන්තු හා සියලුම ආයතන ප්‍රධානීන් දැනුවත් කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | සියලුම අමාත්‍යංශ ලේකම්වරු |



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 16 | පළාත් සභා අරමුදල් වියදම් කිරීමේ බලය ගරු ආණ්ඩුකාරතුමාට පැවරීම සම්බන්ධව | පළාත් සභාවේ ක්‍රියාකාරීත්වය සම්බන්ධව සාමාන්‍ය විධිවිධාන ඇත්තේ පළාත් සභා ව්‍යුහයත් සමඟ වේ. රටේ පාර්ලිමේන්තුව ක්‍රියාත්මක නොවන අවස්ථාවක රටේ අරමුදල් වියදම් කිරීම සම්බන්ධ බලය ජනාධිපතිතුමාට පැවරෙන ලෙසටම ඒ හා සමානව 90(28) පළාත් සභා සංශෝධන යටතේ 27 (අ)වගන්තිය යටතේ " මුදල් වර්ෂය සඳහා වාර්ෂික ගිණුම් ප්‍රකාශය සම්මත කිරීමට පෙර පළාත් සභාවක් විසුරුවා හැරියහොත් හෝ වෙනයම් හේතුවක් නිසා පළාත් සභාවේ කටයුතු සිදු කරගෙන යාම නතර වී ඇති හෝ අවස්ථාවක මෙම කොටසේ ඉහත සඳහන් විධි විධාන කුමක් හෝ සඳහන්ව ඇතද ආණ්ඩුකාරවරයා විසින් අළුත් පළාත් සභාවේ රැස්වීම පිණිස කැඳවනු ලැබ ඇති දිනයේදී හෝ පළාත් සභාව කටයුතු නැවත ආරම්භ කරන දිනයේදී හෝ පළාත් සභාව කටයුතු නැවත ආරම්භ කරන දිනයේදී හෝ මාස තුනක කාල සීමාවක් ඉකුත්වන තුරු එම පළාතේ පරිපාලනය සඳහා ඔහු අවශ්‍යයැයි සලකන අරමුදල් පළාත් සභා අරමුදලට නිකුත් කිරීමට සහ එම අරමුදල වියදම් කිරීමට අවසර දෙනු ලැබිය යුතුය."ලෙස සඳහන් කර ඇති බව ප්‍රධාන නීති නිලධාරී විසින් සඳහන් කරන ලදී.<br><br>ඒ අනුව මෙම පනත අධ්‍යනයකර ඒ පිළිබඳ සියලු අමාත්‍යංශ ලේකම්වරුන් දැනුවත් වන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යංශ ලේකම්වරු<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 17 | වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව | වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට අදාළ වාර්ෂික ස්ථාන මාරු නාම ලේඛනය මේවන විටත් නිකුත්කර ඇති අතර ඊට අදාළව පැන නැඟුනු ගැටළු මත මේ වන විට අත්හිටුවා ඇති බවත් ඒ පිළිබඳ සාකච්ඡා කර තීරණයක් ගැනිමට කමිටුවක් පත්කර ඇති බවත් සාකච්ඡා කරන ලදී.<br><br>ඒ හා සම්බන්ධව පැන නැඟීඇති ගැටළු සම්බන්ධව සාකච්ඡා කළ අතර කමිටු නිර්දේශ අනුව ආණ්ඩුකාරතුමාගේ උපදෙස් මත ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත